# ඉන්ෆ්ලුවන්සා රෝග තත්වය පිළිබඳ පැහැදිලි කිරීමක්

පසුගිය සති කිහිපය තුළ ඉන්ෆ්ලුවන්සා වෛරස ආසාදනයෙන් සිදු වූ මරණ කිහිපයක් කෙරෙහි රට තුළ වැඩි අවධානයක් යොමු විය. මෙම රෝගීන් ඉන්ෆ්ලුවන්සා A සහ B කාණ්ඩ වලට අයත් සාමාන්‍ය සෘතුමය (Seasonal) ඉන්ෆ්ලුවන්සා වෛරස මගින් ආසාදනය වී ඇති බව සිදු කරන ලද පරීක්ෂණ වලින් තහවුරු වී ඇත.

මෙම වෛරස පසුගිය වසර කිහිපය පුරා අප අතර සංසරණය වූ කලින් කලට අප හට සාමාන්‍ය සෙම්ප්‍රතිශ්‍යා උණ නොහොත් Flu' බෝ කරන රෝගී කාරක කාණ්ඩ (Influenza A (H3N2), Influenza A (H1N1)pdm09, Influenza B) වන අතර නව (Novel) වෛරස නොවේ. කෙසේ වෙතත් පසුගිය වසර 2 හා සැසඳීමේදී උණ රෝගීන් අතර ඉන්ෆ්ලුවන්සා වෛරස ආසාදිත රෝගීන් ගේ ප්‍රතිශතයෙහි යම් වැඩි වීමක් මෙම වසරේ මාර්තු අප්‍රේල් මාස වලදී දක්නට ලැබිණ.

මෙම සෘතුමය ඉන්ෆ්ලුවන්සා වෛරස මගින් ඇති කරන සාමාන්‍ය සෙම්ප්‍රතිශ්‍යා උණ නොහොත් Flu' රෝගී තත්ත්වයන් උණ, කැස්ස, සෙම්ප්‍රතිශ්‍යාව ආදී සුළු රෝග ලක්ෂණ පෙන්නුම් කරන අතර බොහෝ විට ප්‍රතිකාර රහිතවම සුව අතට පත්වේ. නමුත් සමහර පුද්ගල කාණ්ඩ විශේෂයෙන් වයස අවුරුදු 65 ට වැඩි පුද්ගලයින්, වයස අවුරුදු 2 ට අඩු දරුවන්, ගර්භනී මව්වරුන්, ප්‍රතිශක්තිය හීන වූ පුද්ගලයින් හා නිදන්ගත හෘද, අක්මා, වකුගඩු, දියවැඩියා ආදී රෝග වලින් පෙළෙන්නන් හට ඉන්ෆ්ලුවන්සා වෛරස ආසාදන තීව්‍ර වීමට හෝ සංකූලතා ඇති වීමට වැඩි අවදානමක් ඇත.

එබැවින් මෙකී රෝගී තත්වය වැළඳුනු පුද්ගලයින් විශේෂයෙන් ඉහත අවදානම් කාණ්ඩ වලට අයත් වන්නන් වැඩි අවධානයෙන් පසුවිය යුතු අතර රෝග ලක්ෂණ වල යම් තීව්‍ර වීමක් හෝ ශ්වසන අපහසුතාවයන් ඇති වුවහොත් හැකි ඉක්මනින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු විය යුතුය.

නේවාසිකව ප්‍රතිකාර ලැබිය යුතු සංකූලතා සහිත රෝගීන් සඳහා නියමිත ප්‍රතිවෛරස ඖෂධ ඇතුළු අනෙකුත් උපකරණ හා අවශ්‍ය උපදෙස් සියළුම රෝහල් වෙත දැනටමත් ලබා දීමට සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු යොදා ඇත.

රෝගය බෝවීම හා පැතිරීම පාලනය සඳහා මනා සෞඛ්‍ය පුරුදු අනුගමනය කළ යුතු අතර ඒ සඳහා කහින විට හා කිවිසින විට ලේන්සුවක් භාවිතා කිරීම, දෙඅත් නිතර සෝදා පිරිසිදුව තබා ගැනීම, සෙම්ප්‍රතිශ්‍යා උණ රෝගයෙන් පෙළෙන විට මුහුණ හෝ නාසය ඇල්ලීමෙන් වැළකීම හා ජනාකීර්ණ ස්ථානයන් හි ගැවසීම අවම කිරීම සුදුසුය. මෙම සෘතුමය ඉන්ෆ්ලුවන්සා රෝගයෙන් වැළකීමට ලබා දිය හැකි එන්නත් දැනට සෞඛ්‍ය ක්ෂේත්‍රය සතුව නොමැත.

මෙම රෝගී තත්වය සාමාන්‍ය රෝගී තත්වයක් විනා අළුත් වෛරසයක් මගින් ඇති වූ හඳුනා නොගත් රෝගී තත්වයක් නොවන බැවින් ජනතාව අනියත බියක් ඇතිකර ගත යුතු නොමැති බව සෞඛ්‍ය අමාත්‍යාංශය අවධාරණය කරයි.

**වෛද්‍ය පබා පලිහවඩන**
**ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ**
**වසංගත රෝග විද්‍යා අංශය**
**2013 මැයි 06**